# State Ministry of Education Reforms, Promotion of Open Universities and Distance Learning

## අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

## G.C.E. ORDINARY LEVEL - Rehearsal Question Paper

## අ.පො.ස. සා/පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

## (Sinhala)

## සිංහල භාෂාව හා සාහිත්‍යය - II

# (QUESTION PAPER) - II

# ප්‍රශ්න පත්‍රය - II



අනුග්‍රහය :

NenasaTV

The National e-learning Portal for The General Education

**අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය**
**සිංහල භාෂාව හා සාහිත්‍යය - II**
**අ.පො.ස.(සා/පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය පැය 1 යි**

- **සැලකිය යුතුයි.**
  - **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රයට හිමි ලකුණු ගණන 80 කි.**

1. අංක (i) සිට (x) තෙක් ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i)සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් පහත සඳහන් අක්ෂර අයත් වන කාණ්ඩ දෙක නම් කරන්න.
(අ) ඓ, ඖ
(අ) ප, ඵ, බ, භ, ම

(ii)පහත සඳහන් පද සඳහා ගැළපෙන විරුද්ධාර්ථ පද ලියා දක්වන්න.
(අ) ස්වාර්ථය
(ආ)ළෙන්ගතු

(iii)පහත දැක්වෙන වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.
(අ) ඔවුහු ඉතා හොඳින් ගීත ගයති.
(ආ)අපි ඉතා භක්තියෙන් පුද පූජා පැවැත්වූයෙමු.

(iv)පහත සඳහන් පද අයත් වන සමාස ප්‍රභේද ලියන්න.
(අ) ගවුම්පොඩිය
(ආ)බඹසුරනර

(v)පහත සඳහන් පද විසන්ධි කර දක්වන්න.
(අ)අවස්ථෝචිත
(ආ)අභ්‍යුදය

(vi)පහත සඳහන් යෙදුම්වල පළමුවැනි හා දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවෙනි වචනය හෝ දෙවැනි වචනය සකස් කර ලියන්න.
(අ)මහාවාලුකා ගඟ
(ආ)ප්‍රතිමා ගෙය

(vii)පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
ඒ හඬින් තුෂ්ණිම්බූත වූ ගම්මු පිළිවෙලට කළ වැඩ අත්හැර දමා පලා ගියහ.

(viii)පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.
(අ) මලු (ආ) මළු

(ix)පහත සඳහන් වාක්‍යවල ඇතුළත් තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා පද වර්ගය ලියා දක්වන්න.
(අ) **බල** සුබ නිමිති පෙරමඟ නැකතටත් වැඩී
(ආ)මගේ අම්මා මට හීනෙන් **පෙනීයන්**

(x)පහත සඳහන් වාක්‍ය සදොස් ය. නිදොස් කර ලියන්න.
(අ)සොල්දාදුවෝ සටන් කරද්දී සතුරෝ පැන දිවූහ.
(ආ)ශිෂ්‍යයෝ හොඳින් උගත යුතු ය.

(ලකුණු 2 x 10 = 20)

02. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය තුළ වඩාත් ඔසවා තැබිය හැකි රාජ්‍යයෙකි. එහෙත් වර්තමාන තත්ත්වය එසේ නොවේ. විශේෂයෙන් ලංකාවට ආවේණික කර්මාන්ත රැසක් ඇත. ඒ කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු වන්නේ නම් රැකියා සම්පාදනය, විදේශ විනිමය ඉපැයීම, පරිසර සුරක්ෂිතතාව වැනි අංශ ගණනාවක් ම ජය ගනු ඇත. දේශීය රෙදිපිළි නිෂ්පාදනය, ස්වාභාවික පරිසරයෙන් ලබා ගන්නා ද්‍රව්‍ය ආශ්‍රිත උපකරණ එනම් වේවැල්, පොල්කටු, තල්පත් ආදී තවත් බොහෝ දේ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කර රට දියුණු කිරීමට කටයුතු කළ යුතු ය.

(ආ) සමස්ත ලෝකය ම කොරෝනා හෙවත් කොවිඩ් 19 නැමති දරුණු ඛේදවාචකයට මුහුණ දී තිබේ. ඒ පිළිබඳ විමසුම් ඇසින් බැලූ කල්හි ස්වභාවධර්මය ලබාදුන් තත්ත්වයන් නොව ඒ සියල්ල මිනිසා විසින්ම නිර්මාණය කළ තත්ත්වයන් බව පෙනේ. තාක්ෂණය, විද්‍යාව කොතරම් දියුණු යැයි පැවසුව ද ඒ එක් ආංශික දියුණුවක් පමණි. එබැවින් පරිසරය රැකෙන දියුණු වැඩපිළිවෙළකට මුළු ලෝකය ම ප්‍රවේශ විය යුතු ය. මිනිසුන් ලක්ෂ ගණන් බිලිගනිමින් පැතිරෙන වසංගත පවසනුයේ අනාගත ව්‍යසනයක පෙරනිමිති නොවේද? එබැවින් මිනිස් ක්‍රියාකාරකම් සියල්ල පාරිසරික හිතකාමී ඒවා විය යුතු ය.

(ඉ) මෙරට අධ්‍යාපන ක්‍රමය පිළිබඳ විවිධ අදහස් සමාජගත වී තිබිණි. අධ්‍යාපනයට සුදුසු රැකියාවක් නැතැ'යි ඇතැමුන්ගේ මතය යි. රැකියාවට සුදුසු අධ්‍යාපනයක් නැතැ'යි තවත් කෙනෙකුගෙ මතය යි. එබැවින් මෙම චෝදනාව නොවන්නට කළ යුත්තේ රටේ, ලෝකයේ දිශානතිය හඳුනා ගෙන ඒ සඳහා වූ අධ්‍යාපනික ක්‍රමවේදයන් යාවත්කාලීන කිරීම යි. ඉන් ප්‍රකාශ වන්නේ කලාව, ඉතිහාසය, පුරාවිද්‍යාව වැනි ක්ෂේත්‍ර නුගැන්විය යුතු බව නොවේ. ඒ සඳහා සුවිශේෂී ස්ථානයක් ද ලබා දිය යුතු ය. සැබැවින් ම අධ්‍යාපන කළමනාකරණය විය යුතු ය.

(ඊ) අනතුරු පිළිබඳ කතාබහ නිමාවක් නොවන්නකි. විශේෂයෙන් මහා මාර්ගය ආශ්‍රිත රිය අනතුරු දිනෙන් දින ඉහළ යයි. රට පුරා මාර්ගවල වාහන සංඛ්‍යාවේ වැඩිවීම වේගවත් ය. රියදුරු බලපත්‍ර ලබාගත් මෙන් ම නොගත් අය ද බහුල වශයෙන් මහා මාර්ගය භාවිත කරනු පෙනේ. මෑත කාලයේ සිදු වූ රිය අනතුරුවලින් අහිමි වූ ජීවිත ගණන ඉතා ඉහළ අගයක් ගනී. අධිවේගී මාර්ග ඉදිවීමට සමගාමී ව සෙසු සාමාන්‍ය මහාමාර්ග ද සංවර්ධනය විය යුතු ය. මාර්ගයට දරාගත හැකි පමණින් වාහන භාවිත විය යුතු ය. මේ සියල්ල නිසිලෙස පාලනය වේ නම් අනතුරු අවම කරගත හැකි වේ.

(ලකුණු 25)

03.පහත දැක්වෙන පාඨය වචන 55 - 65 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

පරිසරය සුරැකීම සඳහා ගතයුතු පියවර ඉතා පැහැදිලි ය. ඒ සඳහා ජනතාව දැනුවත් කිරීමත්, නෛතික රාමුව ශක්තිමත් කිරීමත් අවශ්‍ය අවශ්‍ය ය. එක් එක් රටවල් තනි තනි ව ගනු ලබන ක්‍රියා මාර්ගයන් මෙන් ම ලෝක ප්‍රජාව සාමූහික ව ගනු ලබන ක්‍රියා මාර්ගයන් ද එක සේ ම මේ සඳහා වැදගත් වනු ඇත. ස්වභාවික සම්පත් තිරසාර ලෙස යොදා ගැනීම මෙන් ම සංරක්ෂණය කිරීම, වනගහනය වර්ධනය කිරීම ඒ සඳහා අලුතින් ගස් වැවීම, කාර්මික අපද්‍රව්‍ය පාලනය කිරීම හා කළමනාකරණය, පරිසර දූෂණය පාලනය කිරීම, ජීවීන් රැක ගැනීම, වනජීවීන් රැක ගැනීම, කාබනික පොහොර භාවිතය, රසායනික පොහොර භාවිතය හැකිතාක් දුරට අඩු කිරීම, ජනගහනය පාලනය කිරීම, පරිසරයට ආදරය කිරීම හා පරිසරය සුරැකීමට ජනතාව විශේෂයෙන් ම තරුණ පිරිස් දැනුවත් කිරීම් ආදිය පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ප්‍රමුඛතාවය හිමි විය යුතු කරුණු වශයෙන් පෙන්වා දිය හැකිය. එක් අතකින් පරිසර විනාශය හා පරිසර සුරැකීම අතර අභියෝගයකට මිනිසා මුහුණ දී සිටි. තවත් අතකින් ජනගහන වර්ධනය හා තිරසාර සංවර්ධනය අතර අභියෝගයකට ද මිනිසා මුහුණ දී සිටි. පරිසර මිත්‍රශීලී තිරසාර සංවර්ධන උපාය මාර්ගයක් තුළින් ජනගහන වර්ධනය පාලනය කර ගනිමින් ආර්ථික සංවර්ධනයක් ලබා ගන්නේ කෙසේද යන්න වත්මන් ලෝකය මුහුණ දී ඇති ප්‍රධාන අභියෝගය යි. එම අභියෝගය ජය ගැනීම තුළින් පමණක් අපට පරිසර හානි වළක්වා ගත හැකි බව පැහැදිලි ව පෙනේ. (ලකුණු 10)

04. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

බුදු පිළිමය ලංකාවේ නිර්මාණය වී තිබුණු බවට වංශකතාගත සාධක පැවති මුල් අවධියේ දී ම ලංකාවේ ද බුදුන් වහන්සේ උදෙසා සංකේත වන්දනාව පැවැති බවට පුරාවිද්‍යාත්මක සාධක වේ. විශේෂයෙන් ම බුදුරජාණන් වහන්සේගේ අසීමිත බුද්ධ ගුණය හා රූපකාය මූර්තිමත් කරන නිර්මාණයන් කළ නොහැකි යැ'යි විශ්වාස කරන ලද ථෙරවාදීහු බුදුරජාණන් වහන්සේ වන්දනා සඳහා සංකේත ඉදිරිපත් කළ බව සිතීමට පුළුවන. සාංචි, බාර්හුත් කැටයම්වල බුදුරජාණන් වහන්සේ සංකේතවත් කිරීම සඳහා යොදාගෙන ඇති සංකේත අතරින් වජ්‍රාසනය හා සිරිපතුල් යුවළ, මෙරට මුල් ම යුගයේ බුදුන් වහන්සේ වෙනුවට සැදැහැවතුන්ගේ වන්දනාවට පාත්‍ර වූ සංකේත දෙකක් ලෙස සලකනු ලැබේ. බුද්ධ ප්‍රතිමා රහිත වජ්‍රාසනයෙන් යුතු ආසනඝර නිර්මාණය වූ බවට සාධක වේ. නිදසුන් වශයෙන් අනුරාධපුර අභයගිරි විහාරභූමියේ ඇති ආසනඝරය සහ මඩකලපු දිස්ත්‍රික්කයේ පුළුකුණාවියේ පිහිටි ආසනඝරය ද දැක්විය හැක. මෙම ආසන වන්දනයට වඩා සිරිපතුල් වන්දනය ජනප්‍රිය වූ බව සිතිය හැකි වන්නේ සිරිපතුල් සංකේත දිවයිනේ විවිධ පළාත් වලින් ලැබී තිබෙන බැවිනි. මේවා සිරිපතුල් ගල් ලෙස හඳුන්වනු ලැබේ. මෙම සිරිපතුල්වල අෂ්ඨමංගල ලක්ෂණ ඇතුළු මංගල සංකේත රාශියක් යොදා තිබේ. නමුත් වැදගත් කාරණය වනුයේ ඉහත සඳහන් සංකේත වන්දනය මෙයට සමකාලීන ව ම තවදුරටත් විකාශනය වූ බුද්ධ ප්‍රතිමාවක් ලෙස කෙටි කාලයකින් ම ශ්‍රී ලංකාව තුළ ඉදිරිපත් වී ඇති බවට පුරාවිද්‍යාත්මක සාධක වලින් පැහැදිලි ය.

i) " සිරිපතුල් ගල් "ලෙස නම් කෙරෙන සංකේතවල විශේෂ ලක්ෂණය කුමක් ද?
ii) මුල් යුගයේ දී බුදුන් වහන්සේ වෙනුවට වන්දනාවට පත්වූ සංකේත දෙකක් නම් කරන්න.
iii) "ආසනඝර" දැකිය හැකි ස්ථාන දෙකක් නම් කරන්න.
iv) අසීමිත බුදු ගුණය පිළිබඳ ථෙරවාදීන්ගේ ආකල්පය මෙහි සඳහන් වන්නේ කෙසේ ද?
v) සාමාන්‍ය ජනතාව අතර වඩාත් ජනප්‍රියත්වයට පත් වන්දනා සංකේතය වූයේ කුමක් ද?

(ලකුණු 2 x 5 = 10)

05. ඔබ ප්‍රදේශයේ "සමගි පුස්තකාලය" ට නව සාමාජිකයන් බඳවා ගැනීම මේ දිනවල සිදුවේ. ඒ පිළිබඳ තොරතුරු කිහිපයක් මෙසේ ය.

- නව සාමාජිකයන් සඳහා "සුහුරු සාමාජික ප්‍රවේශ පත්‍රයක්" (Smart Membership Card) නොමිලේ.
- ග්‍රාම සේවා සහතිකය අනිවාර්ය යි.
- මව/ පියා/ භාරකරුගේ කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපිය
- ඇතුළත් වීමේ ගාස්තුව රු. 400කි.
- පිටතට ගෙන යා හැකි පොත් සංඛ්‍යාව 4 ක් දක්වා ඉහළ දමා ඇත.
- බඳවා ගැනීමේ කාලය මාර්තු 20-27 දක්වා වේ.
- සතියේ දිනවල උදේ 9.00 - සවස 4.00 දක්වා විවෘතය.
- සෙනසුරාදා/ඉරිදා/ පෝය දින/ රජයේ නිවාඩු දිනවල පුස්තකාලය වසා ඇත.

ඉහත තොරතුරු ඇතුළත් කරමින් ජනතාව දැනුවත් කිරීම සඳහා සුදුසු අත් පත්‍රිකාවක් පිළියෙළ කරන්න.

**නැතහොත්,**

මුළු ලෝකයට ම තර්ජනයක් වී ඇති කොරෝනා හෙවත් කොවිඩ් 19 රෝගය හේතුවෙන් ලක්ෂ 6 ඉක්මවා ලෝකවාසී ජනතාව මිය ගොස් ඇත. බොහෝ විට මේ තත්ත්වයට හේතු වී ඇත්තේ මහජනයාගේ නොසැලකිල්ල හා නොදැනුවත්බවයි. කොතෙක් දැනුවත් කළ ද ජනයා ප්‍රමාණවත් අනුකූල බවක් නොදක්වයි.

මේ පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රයක් සකස් කරන්න. ඔබ, කොළඹ දිසාව භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා/ තුමිය බව සිතා පිළියෙළ කරන්න.

(ලකුණු 15)